**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදල - 2017**

**-----------------------------------------------------------------------------------------**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 2.1 මතය
-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති
-------------------------------------------

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1
---------------------------------------------

අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට පිළියෙල කර තිබුණු නමුත් ප්‍රමිතයේ 132 (අ) ඡේදය ප්‍රකාරව ඒ බව සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2
---------------------------------------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන හා සත්දින නිවේදන තැන්පතුවල ආයෝජන පිළිවෙලින් රු. 34,279,506 ක් හා රු. 50,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පිළිවෙලින් කාරක ප්‍රාග්ධනය හා මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්වීම වෙනුවට ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

#### 2.2.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
-------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී මුහුණත අගය රු. 211,266,644 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල රු.193,108,516 ක් ආයෝජනය කර තිබුණු අතර ඉන් සමාලෝචිත වර්ෂය තුල කල්පිරී නැවත ආයෝජනය කළ මුහුණත අගය රු. 175,894,652 ක් වූ ආයෝජන සඳහා පාලක සභා නියෝගවල 12 වන නියෝගය ප්‍රකාරව විධිමත් අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය
------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.17,081,641 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.11,611,846 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,469,795 ක වර්ධනයක් විය. භාණ්ඩාගාර බිල්පත් මත වූ පොලී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 5,478,299 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී මූල්‍ය ප්‍රතිඵලය සහ අරමුදලේ දායකත්වය 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ක්‍රමානුකූලව අඩුවී තිබුණු අතර ඉකුත් වර්ෂයේ සිට එය වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු. 17,081,641 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

සමාලෝචිත වර්ෂයේ දී අරමුදල විසින් දායක ගිණුම්වලට බැර කරන ලද පොලිය රු.17,083,755 ක් වූ අතර 2016 වර්ෂයේ එය රු. 11,608,963 ක් ද, 2015 වර්ෂයේදී රු. 7,798,968 ක් ද විය. මේ අනුව 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ ප්‍රතිලාභ ප්‍රමාණය සියයට 49 කින් වර්ධනය වී තිබුණු නමුත් 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වර්ධනය සියයට 47 ක් දක්වා සියයට 2 කින් අඩුවී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------------

අර්ථසාධක අරමුදලේ පරිපාලනය හා කළමනාකරණය සඳහා නියෝග සෑදීමේ බලය 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 27 වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ පාලක සභාවට පවරා ඇති අතර, ඒ අනුව අරමුදලේ දායකයින්ට දායක ගිණුමේ ශේෂයෙන් සියයට 60 ක් පොලී රහිතව වසර 10 කින් ආපසු ගෙවීමේ පදනම මත ණයක් ලබාදීම සඳහා 2007 අගෝස්තු 31 දිනැති අංක 06/2007 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මුදල් චක්‍රලේඛ ලිපියට අනුගාමීව නියෝගයක් සකස් කර ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 57,790,254 ක් සේවකයින් 105 දෙනෙකුට ණය ලෙස ලබාදී තිබුණු අතර ඒ සඳහා කිසිදු පොලියක් අය නොකිරීම හේතුවෙන් අරමුදලේ වර්ධනයට එය අහිත කර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය කිරීම | අරමුදලේ මෙහෙයුම් කටයුතු බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන නමුත් ඒ සඳහා සාධාරණ වූ පරිපාලන වියදමක් අරමුදල වෙනුවෙන් අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | සේවක ණය | සේවක ණය සීමා නොකිරීම මත අරමුදලේ වර්ධනයට එයින් බලපෑම් ඇතිවිය හැකි වීම. |
| (ඇ) | ආයෝජන | පවතින ආයෝජන ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කර නොගැනීම සහ වඩා වාසිදායක නව ආයෝජන ක්‍රමවලට යොමු නොවීම. |